**2025.11.14**

**ගරු හිනිදුම සුනිල් සෙනෙවි මැතිතුමා**
**බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය**
**බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යංශය**
**08 වැනි මහල, සෙත්සිරිපාය,**
**බත්තරමුල්ල.**

**ගරු ඇමතිතුමනි,**

**<u>රාජ්‍ය නාට්‍ය උළෙලේ අවසන්වටය පිළිබඳ රාජ්‍යනාට්‍ය උළෙල අවසන් වටය නියෝජනය කරන නාට්‍යකරුවන්ගේ (දිගු) ප්‍රකාශය.</u>**

2025 රාජ්‍ය නාට්‍ය උළෙල පුනරුදරජයේ පළමුවන ජාතික නාට්‍ය උළෙල වේ. නමුත් මෙම උළෙල කිසිදු පුනරුද බවක් රහිතව පසුගිය රාජ්‍ය නාට්‍ය උළෙලවල් මෙන් කිසිදු ප්‍රචාරයක්, අනුග්‍රහයක්, ප්‍රේක්ෂක සහභාගිත්වයක් මෙන්ම නාට්‍යකරුවන් ආර්ථිකමය ලෙස අසරණභාවයට පත්කරමින් පවත්වන හුදු නාට්‍ය උළෙලක් ලෙස පැවැත්වේ. අනුමණ්ඩලය විසින් කඩිමුඩියේ වසර අවසන්වීමට මත්තෙන් මෙම නාට්‍ය උළෙල නිමාකිරීම පමණක් අරමුණු කොටගෙන පවත්වන බව පෙනේ.

පුවත්පත් හෝ විද්‍යුත් මාධ්‍ය, සමාජ ජාලාවල කිසිදු ආකර්ෂණීය ප්‍රචාරයක් නොමැතිව, නාට්‍යකරුවන් (දිගු හා කෙටි - දෙමළ හා සිංහල) බරපතල ආර්ථික හිංසනයකට ලක් කරමින් පැවැත්වෙන මෙම නාට්‍ය උළෙලට, නාට්‍ය ඉදිරිපත්කරන නාට්‍යකරුවන් පිළිබඳ කිසිදු බරපතල අවධානයක් රහිතව මෙයට කෙටි හා දිග නාට්‍යකරුවන් මන්දෝත්සාහී කරන උළෙලක් බවට පත්ව ඇත. එසේම පළමු වටයට නාට්‍ය ඉදිරිපත් කළ නාට්‍යකරුවන්ද මූලික තීන්දු ගැනීමේදී නොසලකා හරිමින් මෙම උළෙල කිසිදු ජන අවධානයක්, ආකර්ෂණයක් රහිතව පවත්වන නාට්‍ය උළෙලක් බවට පත්ව ඇත. එබැවින් රජය හා නාට්‍ය අනුමණ්ඩලයේ අවධානය පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරන ලෙසත්, එසේ නොවන්නේ නම් අපගේ තීන්දුව කුමක්දැයි පහත දක්වමු.

- මෙම උළෙලේ රෙගුලාසි අනුව දෙවන වටයක් පැවැත්විය යුතු වුවත් එසේ නොකිරීමෙන් නාට්‍ය රඟ දැක්වීමේ අවස්ථා අහිමිවීම මෙන්ම අහිමි වූ දෙවන වටය සඳහා වෙන්කළ මුදල්වලට සිදුවන්නේ කුමක්ද යන්න පිළිබඳ දැනුවත් කිරීම.
- පළමුවන වටය සඳහා නාට්‍ය ඉදිරිපත් කළ සියලුම හා අවසන් වටයට තේරුණු නාට්‍ය සඳහා නාට්‍යකරුවන්ට විශාල පිරිවැයක් දැරීමට සිදුවීම හා එම පිරිවැය සඳහා නාට්‍ය අනුමණ්ඩලයේ කිසිදු ප්‍රතිචාරයක් නොමැතිවිට මේ පිළිබඳ අවධානය යොමුකිරීම.
- අවසන්වටයේ නාට්‍ය ඉදිරිපත් කිරීම සඳහා දිගු හා කෙටි නාට්‍යකරුවන්ට ලබාදෙන මූල්‍ය පහසුකම් ප්‍රමාණවත් නොවන බැවින් එම මුදල දෙගුණයක් කරන ලෙස අප යෝජනා කරන අතර එය කිරීම සඳහා බල කිරීම.
- අවසන් වටයේ නාට්‍ය ප්‍රදර්ශනය සඳහා ලබා දෙන මුදල මෙන් සිවු ගුණයක් පමණ මුදලක් නාට්‍යකරුවන්ට නාට්‍ය ප්‍රදර්ශනය සඳහා වැය වන අතර එම පිරිවැය දිගු හෝ කෙටි නාට්‍ය ඉදිරිපත් කරන නාට්‍ය කරුවන්ට මූල්‍යමය වශයෙන් දරාගත නොහැකි වීම.
  එබැවින් අවසන් වටයේ දිගු හා කෙටි නාට්‍ය සඳහා දැනට ලබාදෙන මුදල දෙගුණයක් කරනමෙන් අප බල කර සිටිමු.

- නාට්‍ය උළෙලේ දිගු හා කෙටි නාට්‍ය සම්මාන සඳහා ලබා දෙන මුදල ප්‍රමාණවත් නොවීම.
  එම මුදල සම්මාන මුදල් දෙන රජයටත්, සම්මාන ලබාගන්නා නාට්‍ය කරුවන්ටත් ලැජ්ජා සහගත මුදලක් බව අපගේ නිරීක්ෂණයයි. සමහර සම්මාන සඳහා ලබාදෙන මුදල පෙදරේරුවෙකුගේ සහායකයෙක් ලබනා දෛනික වැටුපකටත් වඩා පහළ මුදලකි.
  එබැවින් දිගු හා කෙටි නාට්‍ය සම්මාන සඳහා ලබාදෙනමුදල අවම වශයෙන් දෙගුණයක් කරන ලෙස අප යෝජනා කරමු.
- මෙම උළෙලේ නාට්‍ය ප්‍රදර්ශනයේදී ලබාදෙන තාක්ෂණික උපකරණ (ආලෝක පහන්, ධූම උත්පාදන යන්ත්‍ර ආදිය) සඳහා නාට්‍ය කරුවන්ට එම වියදම් පෞද්ගලිකව දැරීමට සිදුවීම.
  අනු මණ්ඩල රැස්වීමේදී ඒවා ලබාදීමට කටයුතු කරන බව දැන්වූවත් මේවනවිට එය එසේ සිදු නොවන අතර එම උපකරණ අනුමණ්ඩලය මැදිහත් වී ලබාදෙන ලෙස හා ඒ සඳහා කටයුතු කරන ලෙස යෝජනා කිරීම. නැතහොත් ඒ සඳහා වන මුල්‍ය පිරිවැය ලබා දීමට කටයුතු කිරීම. එමෙන්ම සම්මත පින්තූර රාමු වේදිකාවෙන් බැහැර වූ තරඟ අංශ නියෝජනය කිරීමට අවශ්‍ය පර්ශද සහ පහසුකම් හෝ මූල්‍ය සහය ලබා දීමට කටයුතු සැලසුම් කිරීම ( පූජිත ද මෙල් - පලිගු රැන)
- නාට්‍ය කරුවන් නාට්‍ය ප්‍රදර්ශනය අතරතුර කණ්ඩායමට සංග්‍රහ කිරීමේ වියදම නාට්‍ය කරුවන්ට දැරීමට සිදුවීම තවත් අපහසුතාවයකි. එම කටයුත්ත අනුමණ්ඩලය මැදිහත් වී ලබාදෙන ලෙස ඉල්ලා සිටිමු. (නාට්‍යයක් සංවිධානය කිරීම අතරතුර එවැනි සංග්‍රහ කටයුතු කිරීම සංවිධායක මණ්ඩලයේ වගකීමකි.) නාට්‍ය සංවිධායකයන්ට එයකිරීමට අපහසුනම් ඒ සඳහා පිළිගත හැකි සංග්‍රහවියදමක් ලබාදීමට කටයුතු කරන ලෙස අප යෝජනා කරමු.
- මෙම නාට්‍ය උළෙල සඳහා ලබාදෙන මුද්‍රිත, විද්‍යුත් හා සමාජ ජාලා ප්‍රචාර ඇත්තේ ඉතාමත් දූර්වල තත්ත්වයක බව අපේ අවධානයයි. නාට්‍ය නැරඹීම සඳහා මීට පෙර තිබූ විශ්වවිද්‍යාල, පාසල් මුල්කරගත් කිසිදු ප්‍රචාරයක් හෝ ප්‍රචාරක දැන්වීමක්වත් මෙම උළෙලේ දක්නට නැත. අවම වශයෙන් පුවත්පත් හෝ විද්‍යුත් මාධ්‍ය (රාජ්‍ය) අනුග්‍රහකත්වයක්වත් නැත. නාට්‍යකරුවන් සමඟ අවමවශයෙන් රාජ්‍ය මාධ්‍ය සමඟ කෙරෙන වැඩසටහනක්වත් නැත. (සභාපතිතුමා හා පිරිසක් එක් දවසක ගොස් කරන ප්‍රචාරයක් මාසයක් පුරා පවත්වන උළෙලක ප්‍රචාරය සඳහා කිසිසේත්ම ප්‍රමාණවත් නැත. එබැවින් වඩාත් ආකර්ෂණීය හා ප්‍රේක්ෂකයා කැඳවාගත හැකි විද්‍යුත්, මුද්‍රිත හා සමාජ ජාලා ප්‍රචාරයක් සඳහා කටයුතු කරන ලෙස අප බල කරසිටිමු. එසේ කොට අවම වශයෙන් දිගු නාට්‍ය ප්‍රවේශ පත්‍රයක් රුපියල් 500/= කටවත් මිල කරන ලෙස යෝජනා කරමු. දැනට ලැබෙන ප්‍රවේශ පත්‍ර ආදායම දිගු නාට්‍ය හෝ කෙටි නාට්‍ය සඳහා කිසිසේත්ම ප්‍රමාණවත් නැත.

උක්ත ඉල්ලීම් ඉටුකිරීමට මුදල් හෝ කාලය නොමැතිනම් අප අවධාරණය කරනුයේ අවශ්‍ය ප්‍රතිපාදන සපයාගෙන නාට්‍යකරුවන්ගේ උක්ත ඉල්ලීම් ඉටුකරන නාට්‍ය උළෙලක් හා පුනරුද රජයේ ගෞරවය රැකෙන නාට්‍ය උළෙලක් පැවැත්වීමට නාට්‍ය උළෙල කල්දමා හෝ එය නිසිලෙස සංවිධානය කරන ලෙසයි. රාජ්‍ය භාණ්ඩාගාරයේ මුදල් උතුරන මෙවැනි යහපත් යුගයක නාට්‍ය උළෙල දැනට පවත්වන ආකාරය රජයේ ද නාට්‍යකරුවන්ගේ ද ගෞරවයට අවමානයක් ලෙස අප දකිමු.

**අපගේ ප්‍රතිචාරය**

1. උක්ත ඉල්ලීම් ඉටුකිරීමට වහාම ඉක්මන් පියවර ගන්නා ලෙස බල කිරීම
2. දැනට පවත්වන නාට්‍ය උළෙල අවලංගු කොට අවශ්‍ය ප්‍රතිපාදන සපයාගෙන පුනරුද රජයට ගෞරවයක්ද, නාට්‍යකරුවන්ට අභිමානයක්ද ලැබෙන ප්‍රචාරයක්, ප්‍රේක්ෂක ප්‍රතිචාරයක්, මූල්‍ය අනුග්‍රහයක් දියහැකි නාට්‍ය උළෙලක් සංවිධානය කිරීමට බල කිරීම.

   මේ පිළිබඳව ප්‍රතිචාරයක් කඩිනමින් නොලැබේ නම්, රාජ්‍ය නාට්‍ය උළෙලේ සියලු දිගු නාට්‍ය අප විසින් ප්‍රදර්ශනය නොකරන බවට දන්වා සිටිමු.

   මෙම ඉල්ලීම් පුනරුද රජයට විරුද්ධ ව්‍යාපාරයක් නොව, පුනරුද රජයේ පළමු ජාතික නාට්‍ය උළෙලට අවශ්‍ය ගෞරවය හිමිකර දීමත්, සියලු නාට්‍යකරුවන්ගේ අභිමානය උදෙසා බවත් දන්වා සිටිමු.

මෙයට,

| **නම** | **නාට්‍යයේ නම** | **අත්සන** |
|---|---|---|
| පරාක්‍රම නිරිඇල්ල | හැඩවෙණ බලු නද | |
| ප්‍රියංකර රත්නායක | Jesus | |
| පූජිත ද මෙල් | පලිගු රැන (Wingfield Family) | |
| බුද්ධික දමයන්ත | මට සිහිනයක් ඇත | |
| ජෙහාන් අප්පුහාමි | Blood Shadows | |
| චාමර ගුරුගේ | අප අතර උෟ | |
| විජිත හෙට්ටිගේ | බරපතලයි එහෙත් ස්ථාවරයි | |

පිටපත්

1. ගරු ආචාර්ය හරිනි අමරසූරිය - අග්‍රාමාත්‍ය / අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය

2. ගරු ලේකම් - බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

3. ගරු සභාපති - නාට්‍ය අනුමණ්ඩලය